"සිංහල රීතිය" ජේ. බී. ගේ අන්තිම පොත් පෙළද?



කර්තෘ - ජේ. බී. දිසානායක
ප්‍රකාශනය - සුමිත පොත්
බෙදාහැරීම - සරසවි පොත්හල

මහාචාර්ය ජේ. බී. දිසානායක ආරම්භයේ පටන් අත ගැසූ ක්ෂේත්‍රයක් වූයේ සිංහල ව්‍යාකරණය හා භාෂා ප්‍රයෝග සරල ලෙස පහදා දීමයි. එය මෙරට බොහෝ වියරණ ඇදුරනට මඟහැරුණු කාරියක් විය. මව් බස කෙනෙකුගේ හද බස වුවත් අපගේ එය අන් බසක් වූයේ බස එකම ව්‍යාකූලයක් කිරීමට අප බොහෝ වියරණ ඇදුරන් හා බස පිළිබඳව ලියන පිරිස් තැත් කළ නිසාය. ජේ. බී. මුල පටන්ම පෙනී සිටියේ බස කාලීන අවශ්‍යතා මත වෙනස් විය යුතු බවටය. ඒ සඳහා අප වියරණයේ පැරණි ගැටමුසු තැන් අත්හැර බසෙහි සුන්දරත්වය පාදා ගත යුතු බවත් ඔහු කීවේය. එහිලා හුදු දේශන පැවැත්වීම පමණක් නොවේ ඔහු කළේ. ඒ වෙනුවෙන් සැලකිය යුතු ග්‍රන්ථ සම්භාරයක්ද කළේය. "භාෂාවක රටා සමුදය", "භාෂාවක භාවිතය හා විග්‍රහය", "මානව භාෂා ප්‍රවේශය", "සමකාලීන සිංහලයඃ ශබ්ද විචාරය", "නූතන සිංහල ලේඛන ව්‍යාකරණයඃ අක්ෂර වින්‍යාසය", සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණයඃ 1. ව්‍යාකරණ ප්‍රවේශය 2. සන්ධි විග්‍රහය", "සිංහල භාෂාවේ නව මුහුණුවර", "සිංහල අක්ෂර විචාරය", "අක්ෂර වින්‍යාස ප්‍රවේශය", "නයනු ණයනු වින්‍යාසය" යනාදී කෘති සම්භාරයම ඊට දෙස් දේ.

මෙවර ජේ. බී. කරළියට පැමිණ ඇත්තේ "සිංහල රීතිය" පොත් පෙළක් ඔස්සේය. "සිංහල අක්ෂර මාලාව", "අක්ෂර හා අක්ෂරාණු", "ණ කාර වින්‍යාසය", "ළ කාර වින්‍යාසය", "පද සන්ධි", "නාම පද නිර්මාණය" යනුවෙන් එහි කෘති හයක් මේ වන විට සුමිත පොත් ප්‍රකාශකයින් වෙතින් නිකුත් වී ඇත. ඉන් කෙරෙන වටිනාම කාර්යය බස යනු අතීතයේ සිරගත කළ යුතු කෞතුකාගාර වස්තුවක් නොව නූතනය හා ගැළපිය යුතු සන්නිවේදන මෙවලමක් බවත්, අතගැසීමට බිය විය යුතු උගුලක් නොව සුන්දර කලා මාධ්‍යයක් වැන්නක් බවත් පෙන්වා දීමයි.

මෙම කෘති මාලාව ජේ. බී. විසින් හඳුන්වා දෙනු ලබනුයේ මෙලෙසිනි:

"'සිංහල රීතිය" නමැති මේ පොත් පෙළේ අරමුණ සිංහල භාෂාවේ නව මුහුණුවර හඳුන්වා දීමයි. හැම ජීව භාෂාවක් ම කාලයාගේ ඇවෑමෙන් පරිණාමයට පත් වේ. අවුරුදු දෙ දහසකටත් වැඩි කාල පරිච්ඡේදයක් තුළ පරිණාමයට පත් වෙමින් එන සිංහලය දැන් සුබනම්‍ය සන්නිවේදන මාධ්‍යයක් බවට පත් වෙමින් පවතී."

ඒ අනුව ජේ. බී. වෙහෙසෙන්නේ සුබනම්‍ය මාධ්‍යයක් බවට පත් වෙමින් යන සිංහලය කෙසේ නිවැරදිව භාවිත කළ යුතුද යනු පහදා දීමටය. මෙහි ඇතුළත් කෘතිවලින් "සිංහල අක්ෂර මාලාව" නමැති කෘතියේ අරමුණ සිංහලයෙන් ලිවීම සඳහා යොදා ගන්නා අකුරු විධිමත්ව හඳුන්වා දීමයි. කලින් කලට හැඩරුවින් මෙන්ම සංඛ්‍යා වශයෙන්ද වෙනස් වුණු මේ අක්ෂර මාලාව දැන් පරිගණක තාක්ෂණයටද යෝග්‍ය වන සේ සකස් වෙමින් පවතී. මේ පොතින් සිංහල අක්ෂර මාලාව ඉදිරිපත් කෙරෙන්නේ පියවරින් පියවරටය. පළමුවැනි පියවර එදා සිට අද දක්වා භාවිත වන විවිධ අක්ෂර මාලා හඳුන්වා දීමයි. සිදත් සඟරා හෝඩිය, අමිශ්‍ර සිංහල හෝඩිය, මිශ්‍ර සිංහල හෝඩිය, ජාතික අධ්‍යාපන ආයතන හෝඩිය හා පරිගණක සිංහල හෝඩිය මේ අක්ෂර මාලා අතරෙහි වේ. දෙවැනි පියවර අක්ෂර ප්‍රභේද හඳුන්වා දීමයි. විවිධ හේතු මත සිංහල අක්ෂර නොයෙක් වර්ගවලට වෙන් කරනු ලැබේ. මූලික වශයෙන් ඒ ප්‍රාණාක්ෂර හා ගාත්‍රාක්ෂර යනුවෙන් දෙකොටසකට වෙන් කෙරේ. අනතුරුව ඒ ප්‍රාණාක්ෂර කෙටි - දික්, පූර්ව - අපර, සරල - සංයුක්ත, විවෘත - සංයුක්ත ආදී වශයෙන් වර්ග කෙරේ. මේ සියල්ල මේ "සිංහල අක්ෂර මාලාව" කෘතියේලා විස්තර වේ.



සිංහල රීතිය - 1
සිංහල අක්ෂර මාලාව
ජේ. බී. දිසානායක



සිංහල රීතිය - 3
ණ-කාර වින්‍යාසය
ජේ. බී. දිසානායක



සිංහල රීතිය - 8
නාම පද නිර්මාණය
ජේ. බී. දිසානායක

මෙහි එන දෙවන පොත වන "අක්ෂර හා අක්ෂරාණු" කෘතියේ අරමුණ ලිවීම සඳහා අවශ්‍ය අක්ෂරත්, ඒවාට සම්බන්ධ අක්ෂරාණුත් හඳුන්වා දීමයි. අක්ෂරාණු තුන් වර්ගයක් මෙහිදී ඉදිරිපත් කෙරේ. ගාත්‍රාක්ෂරයක ගැබ් වන ස්වරය ඉවත් කිරීමට යෙදෙන අල් ලකුණ, ස්වරයක් වෙනුවට යෙදෙන ඇලපිල්ල වැනි පිලි හා ව්‍යංජනයක් වෙනුවට යෙදෙන යංශය වැනි ලකුණු මෙහි විධිමත්ව හඳුන්වා දෙනු ලැබේ.

"ණ කාර වින්‍යාසය" කෘතියේදී පැහැදිලි කෙරෙන්නේ මූර්ධජ ණ කාරය යෙදෙන සැටිය. ඒ පහදා දෙන්නේ රීති අනුසාරයෙන් වීම මෙහි ඇති වෙසෙසයි. මූල රීති, අනුරීති යනුවෙන් හැඳින්වෙන මේ රීති සාවධානව හැදෑරීමෙන් ණ කාරය නිවැරදිව යොදන සැටි පහසුවෙන් ඉගෙන ගත හැකිය. මේ රීති පරිගණකගත කිරීමෙන් සිංහලය අරබයා 'අක්ෂර වින්‍යාසකයක්' (Spell Checker) සාදාගත හැකි බවද පෙන්වා දේ.

"ළ කාර වින්‍යාසය" කෘතියේ අරමුණ මූර්ධජ ළ කාරය යෙදෙන සැටි ඒ අකුර යෙදෙන තැන් අනුව පෙන්වා දීමයි. දන්තජ ල කාරය යෙදෙන සැටි රීති අනුසාරයෙන් පෙන්වා දිය හැකි වුවත් ළ කාරය අරබයා එවැනි රීති නැත. ල කාරය නොයෙදෙන තැන්වල ළ කාරය යෙදිය යුතු බව මෙයින් ගම්‍ය වේ. කෙසේ හෝ ළ කාරය සම්බන්ධ සියලු දුරවබෝධ තැන් මෙහිදී කතුවරයා සරලව පැහැදිලි කරයි.

"පද සන්ධි" හි අභිප්‍රාය එක ළඟ යෙදෙන පද දෙකක් නිවැරදිව සන්ධි කළ යුතු සැටිත්, දැනටමත් සන්ධි වී පවතින පද නිවැරදිව විසන්ධි කළ යුතු සැටිත් රීති මඟින් හෙළි කිරීමයි. මෙහි නිදසුන් දහස් ගණනක් දක්වා ඇත. ඒ සියල්ල උපුටා ගෙන ඇත්තේ ජීවමාන සිංහලයෙනි.

"නාම පද නිර්මාණය" කෘතියේ අරමුණ සිංහලයේ එන පද නමැති භාෂාංගය නිර්මාණයට පදණු නමැති භාෂාංග යෙදෙන සැටිත්, එවැනි පදණු යොදා සරල නාම පද, තද්ධිත නාම පද හා සමාස නාම පද නිර්මාණය කරගන්නා සැටිත් පහදා දීමය. කවර භාෂාවක කවර පද වර්ගයක් වුව නිර්මාණය කරගන්නේ ඒ භාෂාවේ එන රීති හෙවත් රටා මාර්ගයෙනි. නාම පද නිර්මාණයේලා සිංහලයෙහි අනුගමනය කෙරෙන රීති සමුදය මේ පොතෙන් විස්තර කෙරේ. නාම ප්‍රකෘතිවල උපත අනුව ඒ සියල්ල තත්සම, තද්භව හා නිෂ්පන්න වශයෙන් බෙදෙන සැටිද පොත අවසානයෙහි දැක්වේ.

ඉතා සරලව වියරණ රීති පැහැදිලි කිරීම හැරුණු විට මේ කෘති මාලාවේ තවත් වෙසෙසක් නම් හැම පිටු දෙකකට වරක්ම අලුත් දැනුමක් ඇරඹීමය; නව පාඩමක් ඇරඹීමය. එය කෘතිය සරල ලෙස අවබෝධයටත්, එහි ආකර්ෂණයටත් උපකාරී වේ. ඉදිරියේදී මේ කෘති සඳහා තවත් කෘතීන් කිහිපයක් එක් කිරීමටද මහාචාර්යවරයා සූදානම් වේ.

මහාචාර්ය ජේ. බී. භාෂාව සම්බන්ධ වියරණ ග්‍රන්ථ පමණක් නොවේ සම්පාදනය කළේ. ඔහු "පුංචි අපට සිංහල" යනුවෙන් පොත් පෙළක්ද, "සිංහල ජන වහර" යනුවෙන් පොත් පෙළක්ද, "අකුරු මිහිර" යනුවෙන් පොත් පෙළක්ද, සිංහල භාෂාව පිළිබඳව ඉංග්‍රීසියෙන් කෘති 10 ක්ද රචනා කළේය. සැබැවින්ම භාෂාව සම්බන්ධව මෙතරම් පරාසයක විහිදුණු ග්‍රන්ථ රැසක් කළ වාග් විද්‍යාඥයකු හෝ ලේඛකයකු හෝ අපට සොයාගත නොහැකි තරම්ය. එහෙත් ඔහුගේ ඇතැම් කෘතීන් සලකා බැලූ විට එහි එකම කරුණු නැවත නැවත කියවීම නම් දුර්වලතාවක් ලෙස සලකමි. නිදසුනකට "නූතන සිංහල ලේඛන ව්‍යාකරණයඃ අක්ෂර වින්‍යාසය" කෘතියෙහිත්, "සිංහල අක්ෂර විචාරය", "අක්ෂර වින්‍යාස ප්‍රවේශය", "නයනු ණයනු වින්‍යාසය", "ණ කාර වින්‍යාසය" හා "ළ කාර වින්‍යාසය" යන කෘතිවලත් එකම කරුණු බොහෝ විට කියවේ. එහෙත් මා සිතන ලෙස මහාචාර්ය ජේ. බී. මෙහිදී ශාස්ත්‍රීය කෘති සම්පාදනයකට වඩා කර ඇත්තේ වියරණය වහ කදුරු වූ ජන සමාජයට එය සොඳුරු නිම්නයක් බව පහදා දීමය. එනිසා ඔහු ඇතැම් විට එකම කරුණු යළි යළි අවධාරණය කිරීම විසල් ගැටලුවක් ලෙස දැකිය නොහැකිය.

මේ පොත් මාලාව මා අත තබමින් මහාචාර්යවරයා මා සමඟ පැවසූ හැඟීම්බර කරුණක් තිබේ. ඔහු කීවේ "මගෙ අතින් ආපහු පොතක් ලියවෙයිද කියන්න බෑ. මොකද මේ මගේ ජීවිතයේ සැඳෑ භාගයනෙ" යන්නයි. මහාචාර්ය ජේ. බී. සිංහල බස අරබයා කළ සහ දැනටමත් කරන මෙහෙය සැලකූ කල ඔහුගේ ජාතික මෙහෙවර වුවමනාවටත් වැඩිය. එහෙත් අද අපේ භාෂා කාබාසිනියා සමාජය දෙස බලන විට සහ බස අලුත් වීමට එරෙහිව අවි අමෝරන පිරිස සැලකූ කල මා සිතන්නේ ඔහුගේ මෙහෙවරට අඩයක් තබන්නට තවම කල් එළඹ නැති බවයි. එනිසා මහැදුරු ජේ. බී. ට පෑනෙන් වියරණ පෙළහර පෑමට තවත් ආයු බෝ වේවායි පතමු!

රවීන්ද්‍ර විජේවර්ධන